සැබැවින්ම මම ඔබ හැර දමා ගිය පසු පද හතරක් තුන් වරක් ප්රකාශ කර සිටියෙමි. අද දිනයේ ඔබ පවසා සිටි දෑ සමග එය කිරා බැලුවේ නම්, ඒවා බරින් වැඩිය

දේවත්වය විශ්වාස කළ මුඃමින්වරුන්ගේ මෑණිය වූ ජුවෙයිරිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඇය මස්ජිදයේ වාඩි වී සිටිය දී ඈ වෙතින් සුබ්හු සලාතය ඉටු කර උදෑසනින්ම පිටත්ව ගියහ. පසුව හිරු උදාවෙන් පසු නැවත හැරී ආහ. ඒ වනවිටත් ඇය වාඩි වී සිටියාය. "මා ඔබෙන් වෙන් වූ අවස්ථාවේ ඔබ සිටි ස්ථානයේම ඔබ තවමත් සිටින්නෙහි ද?" යැයි විමසුහ. ඇය: "එසේය" යැයි පිළිතුරු දුන්නාය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ
කීහ. "සැබැවින්ම මම ඔබ හැර දමා ගිය පසු පද හතරක් තුන් වරක් ප්රකාශ කර සිටියෙමි. අද දිනයේ ඔබ පවසා සිටි දෑ සමග එය කිරා බැලුවේ නම්, ඒවා බරින් වැඩිය. එනම්: සුබ්හානල්ලාහි වබිහම්දිහි අදද හල්කිහි, වරිළා නෆ්සිහි, වසිනත අර්ෂිහී, වමිදාද කලිමාතිහි."
[صحيح] [رواه مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම බිරිය වූ දේවත්වය විශ්වාස කළ මුඃමින්වරුන්ගේ මෑණිය් වූ ජුවෙයිරිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය වෙතින් සුබ්හු සලාතය ඉටු කර දහවල් ආරම්භයේම පිටත්ව ගියහ. එය ඇය සලාතය ඉටු කළ ස්ථානයේ වාඩිවී සිටිය දීය. පසුව මධ්යහ්නේ ලුහා වේලාවේ නැවත හැරී ආහ. ඒ වන විටත් ඇය එම ස්ථානයේම වාඩි වී සිටියාය. එවිට එතුමාණෝ මෙසේ පවසා සිටියහ. මම ඔබෙන් වෙන්ව ගිය තත්ත්වයේම ඔබ තවමත් සිටින්නෙහි ද? ඇය: එසේය යැයි පැවසුවාය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: ඔබ හැර ගිය පසු මම පද හතරක් පැවසුවෙමි. ඒවා තුන් වරක් ප්රකාශ කළෙමි. ඔබ වාඩි වී ගත කළ මුළු කාලය පුරාවටම ඔබ පවසා සිටි දෑ ඒවායෙහි ඇති කුසල් සමග සසදා බැලුවේ නම් ඒවා මෙයට වඩා උචිත වනු ඇත. "සුබ්හානල්ලාහි" (අල්ලාහ් සුවිශුද්ධය) සියලුම අඩුපාඩුවලින් ඔහු පිවිතුරුය. "වබිහම්දිහි" (ඔහුගේ ප්රශංසාවෙන්) පිදෙන යහමඟ පෙන්වා දීමේ අලංකාර ප්රශංසාවෙන්. "අදද හඃල්කිහි" (ඔහුගේ මැවීමේ ප්රමාණය) අල්ලාහ් හැර වෙනත් කිසිවෙකුට ඒවා ගණනය කළ නොහැක. "වරිළා නෆ්සිහි" (තමන් තෘප්තිමත් වන ප්රමාණයට) තමන් පිළිගත් තම ගැත්තන් ගැන තෘප්තිමත් වන ප්රමාණයටය. කිසිවක් ඔහුට සැඟවෙන්නේ නැත. "වසිනත අර්ෂිහි" (ඔහුගේ රාජධානියේ ප්රමාණය) එය මැවීම් අතරින් අති විශාලය; බරය. "වමිදාද කලිමාතිහි" (ඔහුගේ වදන්හි ප්රමාණයට) අල්ලාහ්ගේ වදන්වලට සීමාවක් නැත; නිමක් නැත. මෙය කොටස් තුනක් ආදාල කර ගන්නා අතර ඒවා සියල්ල ආවරණය කරයි. සැබැවින්ම සුවිශුද්ධයාණන්ගේ වදන් හි ප්රමාණයට අවසානයක් නැත. එයට ස්වරූපයක් නැත සීමාවක් නැත. නමුත් මෙහි අදහස වනුයේ: අධිකත්වය පෙන්වීම අතිශයෝක්තියයි. සැබැවින්ම මැවීම්හි ප්රමාණයන් අතරින් අධිකත්වය ගණන් කිරීම සීමා වන දෑ ගැන පළමුව මෙනෙහි කර; පසුව ඊට වඩා බලවත් දෑ වෙත එය ගෙන ගොස් තම තෘප්තිය ගැන මෙනෙහි කර සිටියේය. පසුව ඉමහත් මැවීමේ ප්රමාණය දන්වා සිටියේය. එය ඔහුගේ රාජධානියයි. පළමුවැන්න ගණනය හා ප්රමාණය සඳහා විය. දෙවැන්න ස්වභාවය හා ක්රමය සඳහා විය. තුන්වැන්න විශාලත්වය හා බර සඳහා විය.


النجاة الخيرية
ALNAJAT CHARITY
لجنة الدعوة الإلكترونية
EDC E-Da'wah Committee